# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date: 2025.12.08 පැය 0545 | දුරකථන අංකය Tel.NO: 011-2887973 | මගේ අංකය My NO: D/Media/Out/2783/2025 | විද්‍යුත් ලිපිනය E-Mails: dir.media@police.gov.lk |


## පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු

### 01. මනුෂ්‍ය ඝාතනයක් - මිහින්තලය පොලිස් වසම.

2025.12.07 වන දින උදෑසන කාලයේ මිහින්තලය පොලිස් වසමේ මහකිරින්දේගම ප්‍රදේශයේ පුද්ගලයෙකු පහරදීමක් හේතුවෙන් අනුරාධපුර රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇති බවට මිහින්තලය පොලිස් ස්ථානය වෙත ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 61 ක් වූ මහකිරින්දේගම, මිහින්තලය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

2025.12.06 වන දින රාත්‍රී කාලයේදී මරණකරු හා ඔහුගේ බිරිඳ අතර ඇති වූ ආරවුලක් දුරදිග යාමෙන් බිරිඳ විසින් මොට ආයුධයකින් පහරදීම හේතුවෙන් මෙම ඝාතනය සිදුව ඇති බවට දැනට සිදු කළ විමර්ශනයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය අනුරාධපුර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අපරාධය සිදුකළ මරණකරුගේ බිරිඳ වන වයස අවුරුදු 53 ක් වන සැකකාරිය අත්අඩංගුවට ගෙන ඇත. මිහින්තලය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

### 02. මනුෂ්‍ය ඝාතනයකට ආධාර අනුබල දුන් සැකකරුවෙකු අත් අඩංගුවට - ගාල්ල අපරාධ කොට්ඨාසය. .

2025.11.04 වන දින අම්බලන්ගොඩ පොලිස් වසමේ අම්බලන්ගොඩ නගර සභාව ආසන්න මාර්ගයේ යතුරුපැදියකින් ගමන් කරමින් සිටි පුද්ගලයෙකු වෙඩි තබා ඝාතනය කිරීම සම්බන්ධයෙන් ගාල්ල අපරාධ කොට්ඨාසය විමර්ශන ආරම්භ කර තිබුණි.

ඒ අනුව මෙම අපරාධය සිදු කළ වෙඩික්කරුට පලා යාමට ආධාර අනුබල ලබාදුන් සැකකරුවෙකු අම්බලන්ගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් 2025.12.07 වන දින සවස් කාලයේදී ඇල්පිටිය පොලිස් වසමේ කුරුඳුගහහැතැක්ම ප්‍රදේශයේදී අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 27 ක් වන එරනවිල, මීටියාගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරු මෙම ඝාතනයේ ප්‍රධාන සැකකරුගේ සහෝදරයා බව වැඩිදුර විමර්ශනයේදී අනාවරණය වී ඇත. ගාල්ල අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03. නීති විරෝධී ලෙස මුහුදු මාර්ගයෙන් මෙරටට ගෙන්වන ලද බීඩි කොළ තොගයක් සමඟ සැකකරුවන් පස් දෙනෙකු අත්අඩංගුවට - මීගමුව කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.**

2025.12.07 වන දින අළුයම් කාලයේ කොච්චිකඩේ පොලිස් වසමේ පෝරුතොට ඉස්සෝ වාඩිය අසලදී මීගමුව කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත එම නිලධාරීන් විසින් වැටලීමක් සිදුකර **නීති විරෝධී ලෙස මුහුදු මාර්ගය ඔස්සේ මෙරටට රැගෙන එන ලද බීඩි කොළ කිලෝ 992 ග්‍රෑම් 750 ක්, එම බීඩි කොළ මෙරටට රැගෙන ඒම සඳහා භාවිතා කළ බෝට්ටු එන්ජින් දෙකක්, බෝට්ටු දෙකක්, බීඩි කොළ ප්‍රවාහනය සඳහා සූදානම් කර තිබූ ලොරි රථයක් සමඟ සැකකරුවන් පස් දෙනෙකු** අත්අඩංගුවට ගෙන කොච්චිකඩේ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**සැකකරුවන් අවුරුදු 32 ත් 38 ත් අතර වයස්වල පසුවන ආඬිඅම්බලම, ලුණුවිල සහ වයික්කාල ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

කොච්චිකඩේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04. යතුරුපැදි සොරකමට සම්බන්ධ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - මීගමුව කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.**

2025.12.07 වන දින උදෑසන කාලයේ වැලිවේරිය පොලිස් වසමේදී මීගමුව කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත එම නිලධාරීන් විසින් වැටලීමක් සිදුකර සීදූව පොලිස් වසමේදී **යතුරුපැදි දෙකක් සොරකම් කල සැකකරුවන් දෙදෙනෙකු** අත්අඩංගුවට ගෙන සීදූව පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**සැකකරුවන් අවුරුදු 21 හා 25 වයස්වල පසුවන තොඩුවාව හා වැලිවේරිය ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

සැකකරුවන් විසින් සොරා ගන්නා ලද යතුරුපැදි දෙක පොලිස් භාරයට ගෙන ඇති අතර, සීදූව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**05. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පනාමුර පොලිස් ස්ථානය.**

2025.12.07 වන දින සවස් කාලයේ පනාමුර පොලිස් වසමේ පනාමුර මිද්දෙණිය මාර්ගයේ ලේල්ලවල ප්‍රදේශයේදී පනාමුර පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 190 ක් සන්තකයේ තබාගෙන කාර් රථයකින් ගමන් කරමින් සිටි සැකකරුවන් දෙදෙනෙකු කාර් රථය හා මත්ද්‍රව්‍ය ද සමඟින් අත්අඩංගුවට** ගෙන ඇත.

**සැකකරුවන් අවුරුදු 27 හා 36 වයස්වල පසුවන සෙවනගල ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

පනාමුර පොලිසිය  වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**